# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,722 — 1966 නොවැම්බර් 18 වැනි සිකුරාදා — 1966.11.18**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 833 | ආදායම හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | — |
| තනතුරු—ඇබෑර්තු .. .. .. .. | 834 | අය-වැය ලේඛන .. .. .. | 839 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | 838 | දේපළ විකිණීම .. .. .. | 846 |
| අතුරු ව්‍යවස්ථා .. .. .. .. | 838 | මාර්ග කොමිටි දන්වීම .. .. .. | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දන්වීම | 839 | විවිධ දන්වීම .. .. .. | 847 |


(සැලකිය යුතුයි.—1964 ජනවාරි සිට ජූනි 30 දක්වා නිකුත් අංක 13,898 සිට 14,088 තෙක් ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පළවේ.)

## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී 67/36

### බටහිර කිරළව කෝරළේ ගම් සභාව

**ප්‍රසිද්ධ රඟ දක්වීම් ආඥාපනත**

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දක්වීම් ආඥාපනතේ 3 වන වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර ඔහු විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාව.

1966 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

ඇම්. තිරුචෙල්වම්.
පළාත් පාලන ඇමති,

ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දක්වීම් ආඥාපනත යටතේ පනවනු ලැබ, 1919 අප්‍රේල් 4 වැනි දින 7,004 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබුවාවූ ද, 1943 අප්‍රේල් 9 වැනි දින අංක 9,108 දරන ගැසට් පත්‍රයෙහි පළ වූ ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධනය කරනු ලැබුවා වූ ද ව්‍යවස්ථා, ඒ ව්‍යවස්ථා බටහිර කිරළව කොරළේ පරිපාලන සීමා තුළ වූ ප්‍රදේශයට අදාළ වන ප්‍රමාණයට, එහි අ 3 වැනි ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" අ 3 (1) මුදල් අය කර පුද්ගලයන් ඇතුළත් කරනු ලබන රඟ දක්වීම් සඳහා යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් බලපත්‍රයක් ඉල්ලා සිටින ඉල්ලුම්කරුවකු විසින්, එකී බලපත්‍රය තමා වෙත නිකුත් කරනු ලැබීමට පෙර, පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගණන් බලනු ලබන ගාස්තුවක් සභාවට ගෙවිය යුතු ය :—

| | එක් දිනකට | එක් මාසයකට | එක් අවුරුද්දකට (දෙසැම්බර් 31 වැනි දිනට අවසාන වේ) |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199කට වැඩි නොවන කල්හි ... | 3 0 | 35 0 | 300 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 කට වැඩි නමුත් 399 කට වැඩි නොවන කල්හි | 5 0 | 50 0 | 500 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 399 කට වැඩි කල්හි ... ... | 10 0 | 100 0 | 600 0 |

(2) ගිණි නොගන්නා ද්‍රව්‍යයන්ගෙන් සාද ඇතැයි සභාව අදහස් කරන ගොඩනැගිලි හා ඉදිකිරීම් සම්බන්ධයෙන් පමණක් වාර්ෂික බලපත්‍ර ප්‍රදානය කළ හැකිය. "

11—835—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජූලි මස 15 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්.ඕ.—බී 139/46

## විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගනු ලැබූ පහත දැක්වෙන යෝජනාව පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ වගන්තියේ (2) වන උප වගන්තිය අනුව පළ කරනු ලැබේ :—

### යෝජනාව

" (267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මේ ගම්සභාව විසින්, සභාවේ පරිපාලන සීමා ඇතුළත ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කර ඇති) විනෝද කටයුතු සඳහා ඇතුළු වීම පිණිස අය කරනු ලබන ගෙවීම් වලින්, මෙහි පහත දැක්වෙන ප්‍රමාණ අනුව බද්දක්, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට මෙයින් පනවා අයකරනු ලැබේ.

| ගෙවන මුදල බදු ප්‍රමාණය හැර ඇතුළුවීමේ ගාස්තුව | බදු ප්‍රමාණය රු. ශ. |
|---|---|
| (අ) ශත 20 ට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... ... | 0 05 |
| (ආ) ශත 50 ට වැඩි නමුත් රු. 1 ට වැඩි නොවන විට | 0 10 |
| (ඇ) රු. 1 ට වැඩි නමුත් රු. 1.50 ට වැඩි නොවන විට | 0 15 |
| (ඈ) රු. 1.50 ට වැඩි නමුත් රු. 2 ට වැඩි නොවන විට | 0 20 |
| (ඉ) රු. 2 ට වැඩි නමුත් රු. 3 ට වැඩි නොවන විට | 0 30 |
| (ඊ) රු. 3 ට වැඩි නමුත් රු. 4 ට වැඩි නොවන විට | 0 40 |
| (උ) රු. 4 ට වැඩි නමුත් රු. 5 ට වැඩි නොවන විට | 0 50 |
| (ඌ) රු. 5 ට වැඩි නමුත් රු. 10 ට වැඩි නොවන විට | 1 00 |
| (එ) රු. 10 ට වැඩි වන විට— | |
| (1) පළමු වෙනි රු. 10 ට ... ... | 1 00 |
| (2) එක් එක් අතිරේක රු. 5 ට හෝ ඉන් කොටසකට ... ... | 1 00" |

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966. 10. 20 වැනි දින,
කොළඹදීය.

11–823—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන (පාලන කොට්ඨාශ) පිළිබඳ ආඥාපනත

### 265 වැනි අධිකාරය

බටහිර කොට්ඨාශය භාර පළාත් පාලන සහකාර කොමසාරිස් බී. ලියනමාන මහතා නැවත දිවයිනට පැමිණ රාජකාරි බාර ගන්නා තෙක්, 1966 ඔක්තෝබර් මස 29 වැනි දින සිට ලංකා පරිපාලන සේවයේ එම්. එල්. එම්. පෙරේරා මහතා බටහිර කොට්ඨාශය භාර පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට පත් කරනු ලැබ සිටින බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
පළාත් පාලන කොමසාරිස්.

1966 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

11–824—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පණතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 13(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර, ඌව කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් මුතු බණ්ඩා සමරකෝන් වන මම, මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ගම්සභාවේ අංක 3 කොට්ඨාශයේ සභික ජිවුල්ගහ ගෙදර රත්කිතා මහතා, පිලිවෙලින් පැවැත්වුනු ගම්සභා රැස්වීම් තුනකට වැඩි ගණනකට සභාවට දැනුම්දීමක් නොකර නොපැමිණි බව ගැන සෑහීමට පත් වී, මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ගම්සභාවේ අංක 3 කොට්ඨාශයේ සභික ජිවුල්ගහ ගෙදර රත්කිතා මහතා, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට තම සභික ධුරය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඇම්. බී. සමරකෝන්,
ඌව කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1966, නොවැම්බර් 5 දින බදුල්ලේදීය.

11–832—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සමග තනතුරුවලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රදේශීක බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනකට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන්

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

## ————තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතන යක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශ යෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දන්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—

සේනාංකය තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශෙෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශෙෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාතේ පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### දෙවැනි ශ්‍රේණියේ පොත් තබන්නන්ගේ තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප.—නියමිත වැටුප් ක්‍රමය : වර්ෂයකට රු. 1,620—18×120—රු. 3,780. වර්ෂයකට රු. 2,820 යන වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමක් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස 1966.12.6 දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ පොත් තැබීම විෂයයක් මෙන් ගෙන ජ්‍යෙෂ්ඨ විභාගයෙන් හෝ ලංඩන් වාණිජ මණ්ඩලයේ විභාගයෙන් (ජ්‍යෙෂ්ඨ සහතිකය) හෝ පොත් තැබීම විෂයයක් මෙන් ගෙන ලංකා වාණිජ මණ්ඩලයේ විභාගයෙන් හෝ පොත් තැබීම විෂයය සහිත ඊට සමාන වූ, නැතහොත් ඊට උසස් විභාගයකින් සමත් වී සිටිය යුත්තාහ. අධ්‍යාපන සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. අයදුම්කරුවන්ට ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටින ලෙස නියම කළ හැකිය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට, 1966.12.6 වන දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 නොවැම්බර් මස 8 දින,<br>
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,<br>
තැ. පෙ. 530,<br>
කොළඹ.

11-868—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—පරගොඩ ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—30×8—24×1 රු. 804 ; රුපියල් 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස : 1966 දෙසැම්බර් මස 6 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩල වල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනිත් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සළකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉංග්‍රීසි භාෂාව, ලිපිලේඛණ පිළියෙල කිරීම හා සිංහල ඉංග්‍රීසි යතුරු පුවරු ක්‍රියා කරවීම පිළිබඳ දැනුම විශේෂ සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

7. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට, 1966 දෙසැම්බර් මස 6 වැනි දිනට හෝ ඊට පළමු පරගොඩ ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ඇස්. ඒ. ගාමිණී පේමචන්ද්‍ර,<br>
පරගොඩ ගම්සභාවේ සභාපති.

1966 නොවැම්බර් මස 8 වැනි දින,<br>
ඉමදුව,<br>
පරගොඩ ගම්සභා කාර්යාලයේ දීය.

11-740—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### වින්නඹු මාතා තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය—රු. 666—42×15—රු. 1,296. රු. 1,086 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමකි. මීට අමතරව රජයේ දීමනා අනුව ජීවනාධාර, විශේෂ ජීවනාධාර සහ ගෙවල් කුලී ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්.—(අ) වයස.—1966.11.30 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ පහත සඳහන් විභාග වලින් සමත්වී සිටිය යුතුය :—අපේක්ෂිකාවන් සිංහල කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ ඊට උසස් විභාගයකින් සමත්වූ ලියාපදිංචි කළ වින්නඹු මාතාවන් විය යුතු අතර, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබා ගත් ප්‍රවීණතා සහතිකයක් ඔවුන් වෙත තිබිය යුතුය. මණ්ඩලීය සෞඛ්‍ය වැඩ ගැන පළපුරුද්දක් ඇති දෙමළෙන් කථා කළ හැකි අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966.11.30 වැනි දිනට හෝ ඊට පළමු වත්තල-මාබෝලෙ නගරයේ විශේෂ කොමසාරිස් තැන වෙත ලැබෙන ලෙස ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ වත්තල-මාබෝලෙ නගරයේ විශේෂ කොමසාරිස් වෙත මිස, වෙන කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. අයදුම් පත්‍රය සමඟ පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් පමණක් එවිය යුතුයි :—

(1) උප්පැන්න සහතිකය.

(2) කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට උසස් විභාගයකින් සමත්වූ විභාගයේ සහතිකය.

(3) වින්නඹු මාතාවන් වශයෙන් ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය සහ ළඟදී ලබා ගත් චරිත සහතික පත්‍ර දෙකක්.

(4) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබා ගත් සහතිකය.

8. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින අයගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණ බවට සහතික කර ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණී.

9. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

10. දැනට ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින අයගේ ඉල්ලුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා මගින් එවිය යුතුය.

ඇම්. ඇල්. ඇම්. පෙරේරා,<br>
විශේෂ කොමසාරිස්,<br>
වත්තල-මාබෝලේ නගරය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,<br>
වත්තල, 66.11.6.

11-593—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—පදවිය ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—30×8—24×1 රු. 804 : රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස : 1966 දෙසැම්බර් මස 6 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයින්ගෙන් හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින අපේක්ෂකයින්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට, 1966 දෙසැම්බර් 6 වැනි දිනට පෙර හෝ පළමු පදවිය ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

එච්. ඒ. කිරිමුදියන්සේ,
සභාපති,
පදවිය ගම්සභාව.

1966 නොවැම්බර් මස 3 වැනි දින,
පදවිය ගම්සභා කාර්යාලයේ දීය.

11–533—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### පහළ ශ්‍රේණියේ ලඝු ලේඛකයින්ගේ (ඉංග්‍රීසි) පත්වීම ස්ථිර කිරීමේ විභාගය

අංක ඩී. 99 සහ 1964 නොවැම්බර් මස 9 වැනි දින දරන චක්‍ර ලේඛ ලිපියේ ප්‍රකාර පහත සඳහන් අපේක්ෂිකාව ඉහත සඳහන් විභාගයේ 'සිංහල' විෂයයට පෙනී සිටීමෙන් නිදහස් කර ඇත.

* ඩී. අබේධීර, ඉංග්‍රීසි ලඝු ලේඛිකා (පහළ ශ්‍රේණිය), මීගමුව නාගරික සභාව.

* විභාගය සම්පූර්ණ කර ඇත.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

තැ. පෙ. 530, කොළඹ,
1966 නොවැම්බර් මස 8 දින,

11–867—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### පළාත් පාලන ලිපිකරු සේවයට බඳවා ගැනීමේ විභාගය—1965.11.20 දින

1966.8.5 දින ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළකරන ලද ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල ලේඛනයට වැඩිදුර වත්ය. ඉහත සඳහන් විභාගය සම්බන්ධයෙන් 1965.7.30 දින ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළකරන ලද දැන්වීමේ 7 වැනි ඡේදය යටතේ පත් කිරීම සඳහා පහත නම් සඳහන් අපේක්ෂකයින් දෙදෙනාද තෝරාගෙන ඇත :—

"බී" ප්‍රදේශය

1. අවුසදහාමි, එච්. ඇම්. ... ආදායම් හා කර්මාන්ත ඕවර්සියර්, ගල්ගමුව ගම් සභාව

2. දයානන්ද, ඊ. ජී. එස්. ... ආදායම් හා කර්මාන්ත ඕවර්සියර්, අකුරැස්ස සුළු නගර සභාව

මෙම අපේක්ෂකයින්ට වහාම පත්වීම් ලබාදීමට කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට පත්වීම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 නොවැම්බර් 8 දින,
තැ. පෙ. 530, කොළඹ.

11–865—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

## ගම්සභා ආඥාපනත

ඇල්.ඩී.—බී 6/66.

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ හම්බන්තොට ඩිස්ත්‍රික්කයේ මිද්දෙනිය ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966. 10. 12,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. පහත දක්වෙන ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර ලෙස සැලකිය යුතුයි :—

ජාඩි හෝ කරවල ගබඩාකිරීම.

තොග ගණනේ විකිණීම සඳහා නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.

මිශ්‍ර පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම.

වීනාකිරි සෑදීම.

සබන් සෑදීම.

හම් පදම්කරණ ස්ථානයක් පවත්වාගෙන යාම.

පුවක් වේලා සකස් කිරීම.

සතුන්ගේ ලේ හෝ අතුනුබහන් උණු කිරීම.

හම් ගබඩා කිරීම.

ඇටකටු ගබඩා කිරීම.

මාලු අයිස් දැමීම.

ලැලි පොගවා සකස් කිරීම.

ෂීට් රබර් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ නිෂ්පාදනය කිරීම.

කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.

ගෝඩා සෑදීම.

දුම්කොළ සෑදීම හෝ සකස් කිරීම.

රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

බීඩි සෑදීම.

සුරුට්ටු සෑදීම.

පැණි සෑදීම

2. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර ලෙස සැලකිය යුතුය :—

කොප්පරා සෑදීම හා ගබඩා කිරීම.

කබොක්ගල්, බොරලු හෝ කළුගල් සඳහා කැනීම.

පිදුරු හෝ කපු පුලුන් ගබඩා කිරීම.

කපාපු පොල් නිෂ්පාදනය කිරීම.

මිණිරන් සකස් කිරීම හෝ ගබඩා කිරීම.

වලක් සාරා හුණුගල් සඳහා තැනීම.

යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම.

කෙඳිවර්ග තෙලීම හෝ ගබඩා කිරීම.

ස්වර්ණාභරණ සෑදීම.

අම්ලකර වායුව සෑව්විචිකරණ යම් කම්හල් ව්‍යාපාරයක්.

මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

තේ කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම.

සිසිල් බීම සෑදීම.

කම්හලක් පවත්වාගෙන යාම.

යන්ත්‍ර මාර්ගයෙන් තෙල් සිඳීම.

3. පහත දැක්වෙන ව්‍යාපාර අක්තරාය දායක සහ අප්‍රසන්න ව්‍යාපාර ලෙස සැලකිය යුතුය. :—

හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස්කිරීම හෝ කැබලිකිරීම.

බැටරි චාජ්කිරීම.

කෙඳි සායම් කිරීම.

ගඩොල් හෝ උළු පිච්චීම.

11–822—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

# පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙළින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1966 නොවැම්බර 5 වැනි දින,
කොළඹදී ය.

උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| | | **මහනුවර දිස්ත්‍රික්කය** |
| | | **යටිනුවර ගඟ පළාත ගම්සභාව** |
| 4 | ... | කැටකුඹුරේ හේරත් මුදියන්සේලා කිරිබණ්ඩා විජේරත්න |
| | | **වවුනියාව දිස්ත්‍රික්කය** |
| | | **මැල්පත්තු දකුණු ගම්සභාව** |
| 3 | ... | අයියම්පිල්ලේ සිදම්බරපිල්ලේ |

11–846—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## හපුතලේ නගර සභාව

### නගර සභා මුදල් රෙගුලාසි අංක 12(II) යටතේ කෙරෙන අයදුම්පත

පහත දැක්වෙන පරිදි ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දැක්වෙන වෙනත් වැය ශීර්ෂයන් යටතේ වැඩිපුර වියදම් වීමට ඉඩ ඇති මුදල් පියවා ගැනීම සඳහා 1966 අයවැය ලේඛණයේ වෙනස්කම් කිරීම, 1966 ඔක්තෝබර් මස 26 වෙනි දින පැවැත්වූ හපුතලේ නගර සභාවේ මාසික රැස්වීමේදී අංක 4 දරණ යෝජනාව අනුව සම්මත කරගන්නා ලදි.

**ඉතිරිය**

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| ඊ.—මහජන සෞඛ්‍ය : | | | | |
| (6) ආරෝග්‍යශාලා— | | | | |
| (සී) අසරණයින්ට | ... | ... | 50 | 0 |
| ඇප්.—මහජන විනෝදය : | | | | |
| (7) ක්‍රීඩාභාණ්ඩ | ... | ... | 250 | 0 |
| ජී.—සොහොන්බිම්— : | | | | |
| (3) ඉදිකිරීම ... | ... | ... | 1,500 | 0 |
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි : | | | | |
| (5) ලී බඩු ... | ... | ... | 500 | 0 |
| | | | 2,300 | 0 |

**අතිරික්තය**

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | | | |
| (2) කාර්යාලයීය වියදම්— | | | | |
| (බී) ගමන් ගාස්තු | ... | ... | 100 | 0 |
| (ඇප්) ලිපිද්‍රව්‍ය, මුද්‍රණගාස්තු ආදිය | | ... | 275 | 0 |
| බී.—මහා මාර්ග : | | | | |
| (1) වේතන— | | | | |
| (බී) ඕවර්සියර්වරු | ... | ... | 50 | 0 |
| සී.—තානායම් හා අම්බලම් : | | | | |
| (6) ආලෝක කිරීම | ... | ... | 375 | 0 |
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි : | | | | |
| (9) ආලෝක කිරීම | ... | ... | 250 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍ය : | | | | |
| (3) වැසිකිළි ශෝධනය— | | | | |
| (සී) ගබඩා ... | ... | ... | 100 | 0 |
| (4) ගවඝාතක මඩු හා ගවගාල්— | | | | |
| (ඒ) වේතන ... | ... | ... | 250 | 0 |
| (බී) නඩත්තුකිරීම | ... | ... | 200 | 0 |
| (7) වෙළඳපොලවල් හා ගාල්— | | | | |
| (බී) නඩත්තුකිරීම | ... | ... | 150 | 0 |
| (එච්) අතිකාල දීමනා | ... | ... | 50 | 0 |
| (1) සාමාන්‍ය— | | | | |
| (ඊ) විෂබීජනාශක ද්‍රව්‍ය | ... | ... | 500 | 0 |
| | | | 2,300 | 0 |

ඇම්. එච්. සමයදස,
හපුතලේ නගර සභාපති.

1966 නොවැම්බර් මස 1 වෙනි දින,
හපුතලේ නගර සභා කාර්යාලයේදීය.

11–826—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

## බලපිටිය උප නගර සභාව

### 1967 අය වැය ලේඛනය

### සාමාන්‍ය අය වැය—කාණ්ඩ 1

| අය ශීර්ෂයෝ | ඇස්තමේන්තු 1967 රු. ශ. | මුළු එකතුව රු. ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම :— | | |
| (1) දේපල තරව ... ... | 33,000 0 | |
| (2) රථවාහන බදු ... ... | 350 0 | |
| (3) බලපත්‍ර ගාස්තු ... ... | 4,000 0 | |
| (4) වෙනත් බදු ... ... | — | |
| (5) මුද්දර ගාස්තු ... ... | 600 0 | |
| (6) මත්පැන් බලපත් ගාස්තු ආපසු ගෙවීම ... | — | |
| (7) අබිං ආදයම් අලාභ ... ... | — | |
| (8) උසාවි දඩ ... ... | 10 0 | |
| (9) වෙන්දේසිකාර හා බ්‍රෝකර් බලපත්‍ර ... | 40 0 | |
| (10) පොලී ... ... | 400 0 | |
| (11) පරණ ද්‍රව්‍ය අලෙවිය ... ... | 200 0 | |
| (12) වැඩිපුර ගෙවීම් ආපසු ලැබීම ... | 10 0 | |
| (13) අල්ලා අයකිරීමේ ගාස්තු ... | 500 0 | |
| (14) රජයේ ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 19,270 0 | |
| (15) මිශ්‍රිත ආදයම් ... ... | 1,200 0 | |
| (16) පොදු කටයුතු සඳහා රජයේ ආධාර ... | 15,000 0 | |
| | | 74,580 0 |
| බී.—මංමාවත් :— | | |
| (1) ඇඟ බදු වෙනුවට ආධාර ... | — | |
| (2) වෙනත් අය ... ... | — | |
| | | — |
| සී.—සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | |
| (1) බදු ... ... ... | 1,620 0 | |
| (2) උපදින දෑ අලෙවිය ... ... | 50 0 | |
| (3) ඉඩම් අලෙවිය ... ... | — | |
| | | 1,670 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ඒ) 4 වැනි කාණ්ඩයේ දඩ ... | — | |
| (බී) වින්නඹු මාතා ගාස්තු ... | — | |
| (සී) මාතෘධාරකාභිවෘද්ධි මධ්‍යස්ථාන— | | |
| (1) රජයේ ආධාර ... ... | 1,500 0 | |
| (2) වෙනත් අය ... ... | — | |
| (2) කැලි කසල— | | |
| (ඒ) ගාස්තු ... ... | — | |
| (බී) අප්‍රයෝජන දෑ අලෙවිය ... | 350 0 | |
| (සී) කොන්ත්‍රාත්කරුවන්ගේ හා කුලීකරුවන්ගේ දඩ ... ... | 10 0 | |
| (3) මළ ප්‍රවාහනය— | | |
| (ඒ) කරව ... ... | — | |
| (බී) ගාස්තු ... ... | 396 0 | |
| (සී) අප්‍රයෝජන දෑ අලෙවිය ... | 12 0 | |
| (ඩී) කොන්ත්‍රාත්කරුවන්ගේ හා කම්කරුවන්ගේ දඩ ... ... | 10 0 | |
| (4) සෝ ඝාතක ස්ථාන හා ගවගාල්— | | |
| (ඒ) ගාස්තු ... ... | 3,000 0 | |
| (බී) අප්‍රයෝජන දෑ අලෙවිය ... | — | |
| (5) ජල සැපයීම්— | | |
| (ඒ) ජල කරව ... ... | — | |
| (බී) පුද්ගලික ජල සැපයීමේ ගාස්තු ... | — | |
| (සී) තහනම් ගාස්තු ... ... | — | |
| (ඩී) පාරිභෝගික කර්මාන්ත ... | — | |
| (ඊ) මාපක බදු ... ... | — | |
| (ඇෆ්) පුද්ගලික ජලනල සම්බන්ධතා ... | — | |
| (6) ආරෝග්‍යශාලා— | | |
| (ඒ) රජයේ ආධාර ... ... | 7,300 0 | |
| (බී) රෝහල් බිම් කුලී ... ... | — | |
| (සී) මහජන ආධාර ... ... | 4,000 0 | |
| (7) පොදු වෙළඳපොලවල් සහ ගාල්— | | |
| (ඒ) කුලී ... ... | 1,750 0 | |
| (බී) කඩ හා බක්කි ... ... | 2,375 0 | |
| (සී) පුද්ගලික වෙළඳ බලපත්‍ර ... | — | |
| (ඩී) බලපත්‍ර ගාස්තු ... ... | — | |
| (ඊ) ධාන්‍ය ගබඩා කුලී ... ... | — | |
| | | 20,703 0 |

| අය ශීර්ෂයෝ | ඇස්තමේන්තු 1967 රු. ශ. | මුළු එකතුව රු. ශ. |
|---|---|---|
| ඊ.—මහජන සාදයෝ :— | | |
| (1) කුලී ... ... ... | — | |
| (2) තණබිම් ගාස්තු ... ... | — | |
| (3) විනෝදාගාර බලපත්‍ර ... ... | 50 0 | |
| (4) විනෝද බදු ... ... | 100 0 | |
| | | 150 0 |
| ඇෆ්.—සුසාන භූමි :— | | |
| (1) ගාස්තු... ... ... | — | |
| (2) මිණී රථ කුලී ... ... | — | |
| (3) සිහිවටන ඉදිකිරීම සඳහා මිණීවලවල් විකිණීම ... ... | — | |
| | | — |
| ජී.—සුණඛ ලියාපදිංචිය :— | | |
| (1) ලියාපදිංචි කිරීමේ ගාස්තු ... | 5 0 | |
| (2) දඩ ... ... ... | — | |
| (3) සුණඛ කරපටි විකිණීමේ ගාස්තු ... | — | |
| (4) ඇල්ලීමේ ගාස්තු ... ... | — | |
| | | 5 0 |
| එච්.—මැනුම් හා කිරුම් :— | | |
| (1) මුද්‍රා කිරීමේ ගාස්තු ... ... | — | |
| (2) දඩ ... ... ... | — | |
| | | — |
| අයි.—ගින්නෙන් ආරක්ෂා කිරීම :— | | |
| (1) ගාස්තු ... ... | — | |
| | | — |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල :— | | |
| (1) ආධාර ... ... | 1,520 0 | |
| (2) දායක මිළ ... ... | — | |
| | | 1,520 0 |
| මුළු එකතුව ... | | 98,628 0 |

### වියදම් ශීර්ෂයෝ

| වියදම් ශීර්ෂයෝ | ඇස්තමේන්තු 1967 රු. ශ. | මුළු එකතුව රු. ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| (1) නිලධාරි වැටුප් (අන් අන්දමකින් අය නොකළ) ... ... | — | |
| (ඒ) ලේකම් ... ... | 2,575 0 | |
| (බී) ලිපිකරුවෝ ... ... | 2,560 0 | |
| (සී) ආදායම් පරීක්ෂක ... ... | 1,265 0 | |
| (ඩී) කාර්යාල කාර්ය සහායක ... | 804 0 | |
| (ඊ) කාර්මික උපදෙස් සඳහා ... | 200 0 | |
| (ඇෆ්) විශ්‍රාම වැටුප් ... ... | — | |
| (ජී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 7,900 0 | |
| (2) සංස්ථා වියදම්— | | |
| (ඒ) දීමනා ... | 1,975 0 | |
| (බී) ගමන් ගාස්තු ... ... | 750 0 | |
| (සී) අයකැමි කම්වු මිළ ... | 3,000 0 | |
| (ඩී) තක්සේරුකාර ගාස්තු ... | — | |
| (ඊ) නීති පිළිබඳ වියදම් ... ... | 200 0 | |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රකාශන හා කාර්යාලීය වියදම් ... ... | 2,500 0 | |
| (ජී) රථවාහන හා බෝට්ටු තහඩු ගාස්තු ... | 125 0 | |
| (එච්) ගණකාධිකාරී ගාස්තු ... | 1,385 0 | |
| (අයි) නිවාඩු දින ගමන් ගාස්තු ... | 300 0 | |
| (ජේ) අමතර වියදම් ... ... | 300 0 | |
| (කේ) කාර්යාල භාණ්ඩ හා උපකරණ ආදිය | 250 0 | |
| (එල්) රෝහල් ගාස්තු ... ... | 100 0 | |
| | | 26,189 0 |
| (3) ආපසු ගෙවීම් ... ... | 10 0 | |
| (4) දායක මිළ හා ආධාර ... ... | 800 0 | |
| | | 810 0 |

| වියදම් ශීර්ෂයෝ—සම්බන්ධයි | ඇස්තමේන්තු 1967 රු. | ශ. | මුළු එකතුව රු. | ශ. |
|---|---|---|---|---|
| බී.—මංමාවත් :— | | | | |
| (1) වැටුප් හා කුලී— | | | | |
| (ඒ) කර්මාන්ත අධිකාරී... ... | — | | | |
| (බී) ඕවර්සියර් ... ... | 900 | 0 | | |
| (සී) කුලිකරුවෝ ... ... | — | | | |
| (2) නඩත්තු ... ... | 5,000 | 0 | | |
| (3) යන්ත්‍ර හා ආවුධ ... ... | 200 | 0 | | |
| (4) වීථි ආලෝකය ... ... | 10,000 | 0 | | |
| (5) කැලි කසල බාල්දි ... ... | — | | | |
| (6) නිළහන හා මිළ දර්ශණ ... | — | | | |
| (7) ඉඩම් අයත්කර ගැනීම ... | — | | | |
| (8) සංස්කරණ ... ... | — | | | |
| (9) ණය ගාස්තු ... ... | — | | | |
| (10) සෙවන දෙන ගස් ... ... | — | | | |
| (11) භූමාපණයෝ ... ... | — | | | |
| (12) අළුත් වැඩ ... ... | 2,500 | 0 | | |
| (13) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 1,240 | 0 | | |
| | | | 19,840 | 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | | | |
| (1) කුලී ... ... ... | 715 | 0 | | |
| (2) අයකැම් කම්වු මිළ ... ... | — | | | |
| (3) කාර්යාලීය කුලී ... ... | — | | | |
| (4) නඩත්තු ... ... | 1,100 | 0 | | |
| (5) ලී බඩු... ... ... | — | | | |
| (6) ණය ගාස්තු ... ... | 4,590 | 0 | | |
| (7) අලුත් වැඩ ... ... | — | | | |
| (8) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 980 | 0 | | |
| | | | 7,385 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | | | |
| (1) සාමාන්‍ය— | | | | |
| (ඒ) වැටුප් : | | | | |
| (1) සෞඛ්‍ය පරීක්ෂක ... | 360 | 0 | | |
| (2) සෞඛ්‍ය සේවිකාවෝ ... | — | | | |
| (3) වින්නඹු මාතාවෝ ... | ,360 | 0 | | |
| (4) සෞඛ්‍ය ඕවර්සියර් ... | — | | | |
| (බී) කුලී ... ... | — | | | |
| (සී) දීමනා ... ... | 84 | 0 | | |
| (ඩී) නිළ ඇඳුම් ... ... | — | | | |
| (ඊ) මුද්‍රණ ගාස්තු ... ... | 25 | 0 | | |
| (ඇෆ්) විෂනාශක ද්‍රව්‍ය ... ... | 100 | 0 | | |
| (ජී) බෙහෙත් හා උපකරණ ... | — | | | |
| (එච්) කාණු ඉදිකිරීම ... ... | 1,500 | 0 | | |
| (අයි) කාණු සඳහා අලාභ ... | — | | | |
| (ජේ) සෞඛ්‍ය සති වැය ... ... | — | | | |
| (කේ) කිරි පිළිබඳ සෞඛ්‍ය ගාස්තු ... | — | | | |
| (ඇල්) මහාමාරි සංහාරය ... ... | — | | | |
| (ඇම්) වසූරි සංහාරය ... ... | — | | | |
| (ඇන්) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ... | 1,500 | 0 | | |
| (ඕ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | — | | | |
| (පී) මැලේරියා සංහාරය ... | 100 | 0 | | |
| (2) කැලි කසල— | | | | |
| (ඒ) කුලී ... ... | 5,160 | 0 | | |
| (බී) ගොන් කරත්ත හා ලොරි ... | 1,000 | 0 | | |
| (සී) ගබඩා ... ... | 150 | 0 | | |
| (ඩී) කුණු පෝරනු ... ... | — | | | |
| (ඊ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 7,250 | 0 | | |
| (ඇෆ්) කරත්ත මඩු හා ගබඩා ... | — | | | |
| (3) මළ ප්‍රවාහනය— | | | | |
| (ඒ) කුලී ... ... ... | 1,340 | 0 | | |
| (බී) ගොන් කරත්ත හා ලොරි ... | 400 | 0 | | |
| (සී) ගබඩා ... ... | 250 | 0 | | |
| (ඩී) මළමූත්‍ර තැන්පත් කිරීමේ කුලී ... | — | | | |
| (ඊ) වැසිකිළි නඩත්තුව ... ... | 1,000 | 0 | | |
| (ඇෆ්) ඉඩම් අයත්කර ගැනීම ... | — | | | |
| (ජී) ඉදිකිරීම ... ... | — | | | |
| (එච්) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 1,900 | 0 | | |
| (4) සෝ ඝාතක ස්ථාන හා ගවහල්— | | | | |
| (ඒ) කුලී ... ... | — | | | |
| (බී) නඩත්තු ... ... | — | | | |
| (සී) ඉඩම් මිළට ගැනීම ... | — | | | |
| (ඩී) ඉදිකිරීම ... ... | — | | | |
| (ඊ) ගව වසන්ගත ... ... | — | | | |
| (ඇෆ්) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | — | | | |
| (5) ජල සැපයීම— | | | | |
| (ඒ) කුලී ... ... | — | | | |
| (බී) ගබඩා ... ... | — | | | |
| (සී) නඩත්තු ... ... | 500 | 0 | | |
| (ඩී) ඉඩම් මිලට ගැනීම ... | — | | | |
| (ඊ) ඉදිකිරීම ... ... | — | | | |
| (ඇෆ්) ණය ගාස්තු ... ... | — | | | |
| (ජී) අයකැම් කම්වු මිළ ... | — | | | |
| (එච්) පොදු නාන ස්ථාන ... ... | — | | | |
| (අයි) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | — | | | |
| (ජේ) ජල පිළිබඳ රස වෛද්‍ය ... | — | | | |
| (6) ආරෝග්‍යශාලා— | | | | |
| (ඒ) කුලී ... ... | 2,093 | 0 | | |
| (බී) නඩත්තු ... ... | 6,500 | 0 | | |
| (සී) පුලන්නෝ ... ... | — | | | |
| (ඩී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 3,130 | 0 | | |
| (7) පොදු වෙළඳපොලවල් සහ ගාල්— | | | | |
| (ඒ) කුලී ... ... | — | | | |
| (බී) නඩත්තු ... ... | 3,500 | 0 | | |
| (සී) මුද්‍රණ ගාස්තු ... ... | — | | | |
| (ඩී) ඉදිකිරීම ... ... | — | | | |
| (ඊ) වන්දි ... ... | — | | | |
| (ඇෆ්) ඉඩම් අයත්කර ගැනීම ... | — | | | |
| (ජී) ණය ගාස්තු ... ... | 2,015 | 0 | | |
| (එච්) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | — | | | |
| | | | 40,217 | 0 |
| ඊ.—මහජන සාදයෝ :— | | | | |
| (1) කුලී ... ... ... | — | | | |
| (2) නඩත්තු ... ... | — | | | |
| (3) බැන්ඩ් ක්‍රීඩා දීමනා ... ... | — | | | |
| (4) අඩම් අයත්කර ගැනීම ... ... | — | | | |
| (5) දායක මිළ හා ආධාර ... ... | — | | | |
| (6) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | — | | | |
| (7) විනෝද බදු ... ... | — | | | |
| | | | — | |
| ඇෆ්.—සුසාන භූමි :— | | | | |
| (1) කුලී ... ... ... | — | | | |
| (2) නඩත්තු ... ... | — | | | |
| (3) ඉදිකිරීම ... ... | — | | | |
| (4) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | — | | | |
| | | | — | |
| ජී.—සුනඛ ලියාපදිංචිය :— | | | | |
| (1) සුනඛයන් විනාශ කිරීම ... ... | 200 | 0 | | |
| (2) අයකැම් කම්වු මිළ ... ... | — | | | |
| (3) සුනඛ කරපටි මිළ ... ... | — | | | |
| (4) අල්ලන්නන්ගේ ගාස්තු ... | — | | | |
| (5) සුනඛ ගල් නඩත්තු ... ... | — | | | |
| (6) ඉදිකිරීම ... ... | — | | | |
| | | | 200 | 0 |
| එච්.—මැනුම් හා කිරුම් :— | | | | |
| (1) පරීක්ෂක ගාස්තු ... ... | — | | | |
| (2) ගබඩා ... ... | — | | | |
| | | | — | |
| අයි.—ගිණි ආරක්ෂාව :— | | | | |
| (1) ගිණි නිවීමේ භාණ්ඩ ... ... | — | | | |
| | | | — | |

| වියදම් ශීර්ෂයෝ—සම්බන්ධයි | ඇස්තමේන්තු 1967 | | මුළු එකතුව | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල :— | | | | |
| (1) වැටුප් ... ... | 590 | 0 | | |
| (2) කුලී ... ... ... | — | | | |
| (3) පොත් පත් හා සඟරා ... ... | 1,000 | 0 | | |
| (4) ලී බඩු ... ... | 350 | 0 | | |
| (5) නඩත්තු ... ... | 150 | 0 | | |
| (6) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 950 | 0 | | |
| | | | 3,040 | 0 |
| මුළු එකතුව ... | | | 97,681 | 0 |

1966ක්වූ නොවැම්බර් මස 1 වන දින පවත්වන ලද උප නගර සභා රැස්වීමේ දී සකස් කරනු ලැබ සම්මුති අංක 5 යටතේ සම්මත කොට පිළිගන්නා ලදී.

ජී. එච්. සිල්වා,
සභාපති,
බලපිටිය උප නගර සභාව.

1966ක්වූ නොවැම්බර් මස 2 වන දින,
බලපිටිය උප නගර සභා කාර්යාලයේදීය.

## 2 කාණ්ඩය—විදුලි බල අංශය

### අය වැය ලේඛනය 1967

| අය ශීර්ෂයෝ | ඇස්තමේන්තු 1967 | | මුළු එකතුව | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| 1. විදුලි බල මිළ කිරීම ... ... | 90,000 | 0 | | |
| 2. මාපක කුලී ... ... | 900 | 0 | | |
| 3. වීථි ආලෝකය ... ... | 10,000 | 0 | | |
| 4. පාරිභෝගිකයින්ට කළ වැඩ ... | 6,000 | 0 | | |
| 5. මිශ්‍රිත ආදයම් ... ... | 400 | 0 | | |
| 6. ආපසු ගෙවීම් ... ... | 25 | 0 | | |
| 7. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 9,925 | 0 | | |
| | | | 1,17,250 | 0 |

| වැය ශීර්ෂයෝ—සම්බන්ධයි | ඇස්තමේන්තු 1967 | | මුළු එකතුව | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| 1. විද්‍යුත්පාදනය (ජනක) :— | | | | |
| (ඒ) දුවෙන දැ ... ... | — | | | |
| (බී) තෙල් හා ගබඩා ද්‍රව්‍ය ආදිය ... | — | | | |
| (සී) වැටුප්, කුලී හා දීමනා ... | — | | | |
| (ඩී) විදුලි බල මිළයට ගැනීම ... | 60,000 | 0 | | |
| | | | 60,000 | 0 |
| 2. සංස්කරණ කටයුතු :— | | | | |
| (ඒ) ගොඩනැගිලි ... ... | — | | | |
| (බී) යන්ත්‍ර, බොයිලේරු හා උපකරණ ... | — | | | |
| (ඒ) මාපක, යතුරු, ඇණ හා උපකරණ ... | 2,000 | 0 | | |
| (ඩී) ප්‍රවාහන මාර්ග නඩත්තු හා සැපයීම් ... | 4,000 | 0 | | |
| | | | 6,000 | 0 |
| 3. නිවාස සම්බන්ධතාවෝ :— | | | | |
| (ඒ) උපකරණ ... ... | 4,000 | 0 | | |
| (බී) කුලී (තාවකාලික) ... ... | 500 | 0 | | |
| | | | 4,500 | 0 |
| 4. පාලන පිළිබඳ සාමාන්‍ය වියදම් :— | | | | |
| (ඒ) වැටුප් හා දීමනා (පාලන) ... | 6,247 | 0 | | |
| (බී) වැටුප් හා දීමනා (බාහිර) ... | 5,555 | 0 | | |
| (සී) මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය ... ... | 1,000 | 0 | | |
| (ඩී) සුළු වැය ... ... | 2,345 | 0 | | |
| | | | 15,147 | 0 |
| 5. ණය ගාස්තු :— | | | | |
| (ඒ) පොලී ... ... | 300 | 0 | | |
| (බී) ණය මුදල් ආපසු ගෙවීම ... | 17,160 | 0 | | |
| | | | 17,460 | 0 |
| 6. දීර්ඝ කිරීම් හා සංවර්ධන ... ... | | | 3,000 | 0 |
| 7. ක්ෂය සඳහා සංචිතය වෙනුවෙන් ... | | | 1,000 | 0 |
| 8. ආපසු ගෙවීම් ... ... | | | 25 | 0 |
| 9. පොදු ආදයමෙන් ලබාගත් අත්තිකාරම් ... | | | — | |
| 10. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | | | 9,925 | 0 |
| මුළු එකතුව ... | | | 1,17,057 | 0 |

1966ක්වූ නොවැම්බර් මස 1 වන දින පවත්වන ලද උප නගර සභා රැස්වීමේදී සකස් කරනු ලැබ සම්මුති අංක 5 යටතේ සම්මත කොට පිළිගන්නා ලදී.

ජී. එච්. සිල්වා,
සභාපති,
බලපිටිය උප නගර සභාව.

1966ක්වූ නොවැම්බර් මස 2 වන දින,
බලපිටිය උප නගර සභා කාර්යාලයේ දීය.

11–818—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## බලපිටිය උප නගර සභාව

### 1966 අය වැය ලේඛනය

### මුදල් නියෝග 40(II) යටතේ කෙරෙන අයදුම්පත

1966 අය වැය ලේඛනයේ ඒ ඒ වැය සිරස් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතුරු වේයැයි ගණන් බලන ලද පහත පෙනෙන වැය සිරස් යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය සිරස් වලට මාරුකර අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම සිරස් යටතේ යෙදීමට 1966ක් වූ නොවැම්බර් මස 1 වෙනි දින පවත්වන්නට යෙදුන මාසික සභා රැස්වීමේදී අංක 10 දරණ සම්මුතියෙන් සභා සම්මත විය.

**මුදල් ඉතුරු වැය සිරස්**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1(ඒ) ලේකම් ... ... ... | 5 | 0 |
| ඒ.—1(බී) ලිපිකරුවෝ ... ... ... | 50 | 0 |
| ඒ.—1(ඊ) කාර්මික උපදෙස් ... ... | 100 | 0 |
| ඒ.—2(සී) අයකැමි කම්වු මිළ ... ... | 250 | 0 |
| ඒ.—2(ජී) රථවාහන තහඩු ... ... | 19 | 75 |
| ඒ.—2(එච්) ගණකාධිකාරි ගාස්තු ... ... | 30 | 0 |
| ඒ.—2(එල්) රෝහල් ගාස්තු ... ... | 100 | 0 |
| සී.—4 නඩත්තු ... ... ... | 100 | 0 |
| ඩී.—1(සී) දීමනා ... ... ... | 200 | 0 |
| ඩී.—1(ඊ) මුද්‍රණ ගාස්තු ... ... ... | 25 | 0 |
| ඩී.—1(එෆ්) විශනාශක ද්‍රව්‍ය ... ... | 100 | 0 |
| ඩී.—1(ඇන්) මාතෘදරකාභිවෘධි මධ්‍යස්ථානය ... | 103 | 05 |
| ඩී.—7(බී) නඩත්තු ... ... ... | 150 | 0 |
| ඩී.—7(ජී) ණය ගාස්තු ... ... ... | 50 | 0 |
| ජී.—1 බල්ලන් විනාශ කිරීම ... ... | 100 | 0 |
| එකතුව ... | 1,382 | 80 |

**මුදල් අවශ්‍ය වැය සිරස්**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—2(බී) ගමන් ගාස්තු... ... ... | 150 | 0 |
| ඒ.—4 දයක මිළ හා ආධාර ... ... | 300 | 0 |
| බී.—2 නඩත්තු ... ... ... | 300 | 0 |
| සී.—1 කුලී ... ... ... | 20 | 0 |
| සී.—6 ණය ගාස්තු ... ... ... | 20 | 0 |
| සී.—8 ජීවනාධාර ... ... ... | 40 | 0 |
| ඩී.—1(එච්) කාණු ඉදිකිරීම ... ... | 500 | 0 |
| ඩී.—2(සී) ගබඩා ... ... ... | 50 | 0 |
| ඩී.—3(සී) ගබඩා ... ... ... | 0 | 80 |
| ඩී.—6(ඩී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 2 | 0 |
| එකතුව ... | 1,382 | 80 |

| මුදල් ඉතුරු වැය සිරස් | රු. | ශ. | මුදල් අවශ්‍ය වැය සිරස් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| **දෙවෙනි කොටස විදුලි** | | | | | |
| විදුලි 4(සී) මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය ... ... | 200 | 0 | විදුලි 2(සී) මාපන යතුරු හා ඇන ... ... | 700 | 0 |
| විදුලි 5(ඒ) පොලී ... ... ... | 1,000 | 0 | විදුලි 3(ඒ) උපකරණ ... ... ... | 500 | 0 |
| එකතුව ... | 1,200 | 0 | එකතුව ... | 1,200 | 0 |

ජී. එච්. සිල්වා,
සභාපති,
බලපිටිය උප නගර සභාව.

1966ක්වූ නොවැම්බර් මස 2 වන දින,
උප නගර සභා කාර්යාලය,
බලපිටිය.

11–801/1—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## බලපිටිය උප නගර සභාව

### දෙවෙනි අතිරේක අය වැය ලේඛනය 1966

### දෙවෙනි කොටස (විදුලි)

| | ගණන් බලන ලද වියදම් රු. | ශ. |
|---|---|---|
| විදුලි 3—නිවාස සම්බන්ධතාවෝ :— | | |
| (ඒ) උපකරණ ... ... ... ... | 2,750 | 0 |
| එකතුව ... | 2,750 | 0 |

වර්ෂ 1966ක්වූ නොවැම්බර් මස 1 වෙනි දින පැවැත්වූ මාසික සභා රැස්වීමේදී පිළිගනිමින් යෝජනා අංක 10(අ) පරිදි සම්මත කරන ලදි.

ජී. එච්. සිල්වා,
සභාපති,
බලපිටිය උප නගර සභාව.

1966ක්වූ නොවැම්බර් මස 2 වන දින,
උප නගර සභා කාර්යාලය,
බලපිටිය.

11–801/2—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## රක්වාන සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40(II) යටතේ කෙරෙන අයදුම්පතයි

1966 අය වැය ලේඛණයේ ඒ ඒ සිරස යටතේ වෙන් කරන ලද මුදල ඊට අනුරූපව දක්වෙන වැය සිරසට මාරුකර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම සිරස යටතේ යෙදීමට 1966ක්වූ සැප්තැම්බර් මස 30 වෙනි දින පවත්වන ලද මෙම සුළුනගර සභාවේ යෝජනා අංක 9 යටතේ සම්මත විය.

| සාමාන්‍ය අතිරික්තය | රු. | ශ. | අතිරේක ප්‍රතිපාදනය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—2(ඒ) දීමනා ... ... ... | 125 | 0 | ඒ.—1(බී) වැටුප් ලිපිකරු ... ... | 390 | 0 |
සුළු නගර සභා ආඥාපනතේ (256 වෙනි පරිච්ඡේදයේ) අංක 161 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛණයෙහි නම් කරන ලද රථවාහන හා සතුන්ට ඒ ලේඛනයෙහි එම වාහන හා සතුන් ඉදිරියෙන් සඳහන් කර තිබෙන බදු, 1966 වර්ෂයට මෙන්ම 1967 වර්ෂයටද, පනවා ඇති බවත්,

(2) යථෝක්ත ආඥාපනතේ 162 (3) වෙනි වගන්තිය යටතේ එකී බදු, 1967 මාර්තු 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්, හෝමාගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

විල්ප්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

1966 ඔක්තෝම්බර් මස 30 වෙනි දින,
හෝමාගම සුළු නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින්රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන යම් ඕනෑම වාහනයක් සඳහා ඕනෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රදියක් හෝ කරත්තයක් :—

| | රු. ශ. |
|---|---|
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 00 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 00 |
| (ඇ) ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින කරත්තයකට ... ... | 4 00 |
| (ඈ) ඕනෑම අන්දමක තනිගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 2 50 |
| (ඉ) ඕනෑම අත්කරත්තයකට ... ... | 2 50 |

11-842/3—66.11.18 දින අංක 14,722 දරණ ගැසට් පත්‍රය

## කඳුපිට පත්තු (උතුර සහ දකුණ) ගම්සභාව—අටාල

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයන්හි 1967 වර්ෂයට හරක්මස් සහ එළු මස් විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බව 1947 අංක 44 දරණ ආඥපනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත ගෝඝාතක ආඥපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කඳුපිට පත්තු (උතුර සහ දකුණ) ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකු විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධවන්නේ කුමන හේතූන් නිසාද යනාවග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇම්. ඇල්. ඒ. වාහිද්, මත්තමගොඩ, කොටියකුඹුර | ... අංක 137, කඩවත වත්ත, කොටියකුඹුර | ... එළුහරක් මස් |
| 2. ඇම්. ඇල්. ඒ. වාහිද්, මත්තමගොඩ, කොටියකුඹුර | ... කඩවත වත්ත, කොටියකුඹුර | ... එළු මස් |

ඩබ්ලිව්. ජයසූරිය,
කඳුපිට පත්තු ගම්සභාවේ සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
අටාල.
1966.11.7

11-863—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## කටුගන්නාව පළාත් ආණ්ඩු සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් අය විසින් 1967 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන කටුගන්නාව පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයෙහි පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, එසේ මස් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වෙනි අධිකාරයේ) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඉෂැඩ්. ඇම්. කලීල් මයා. ... ... ... | හරක් මස් වෙළඳාම | ... අංක 41/5, මහනුවර පාර, කටුගන්නාව |
| 2. ඇම්. එච්. කරීම් මයා. ... ... ... | එළුමස් වෙළඳාම | ... අංක 41/1, මහනුවර පාර, කටුගන්නාව |

ජෝර්ජ් ගුනසේකර,
සභාපති,
පළාත් ආණ්ඩු සභාව, කටුගන්නාව.

පළාත් ආණ්ඩු සභාකාර්යාලය,
කටුගන්නාව,
1966.11.3.

11-815—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## පස්සර සුළු නගර සභාව

### 1967 වරිපනම් ලේඛණ

1967 වර්ෂය සඳහා මෙම නගර සභාවේ වරිපණම් ලේඛණ දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන් හිදී මෙම කාර්යාලයේ දී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, 256 වැනි අධිකාරයවූ සුළු නගර සභා ආඥපණතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරයවූ මහ නගර සභා ආඥපණතේ අංක 235 (1) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇ. පී. ඇඩ්වින්,
සභාපති,
සුළු නගර සභාව, පස්සර.

1966 ක් වූ නොවැම්බර් මස 1 වන දින,
පස්සර සුළු නගර සභා කාර්යාලයේ දීය.

11-825—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට නගර සභාව

### වාහන හා සත්ව බද්ද—1967

නගර සභා ආඥපනතේ 255 වෙනි පරිච්ඡේදයේ අංක 162 වන වගන්තිය යටතේ පහත සඳහන් උප ලේඛනය අනුව 1967 අවුරුද්දට වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා ඇති බවද, එම පනතේ අංක 163 (3) යටතේ එම බදු 1967 මාර්තු 31 වන දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| 1. මෝටර් රථ, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ කරත්ත, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයක් | 5 00 |
| 2. බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් මෝටර් රථයක් හෝ කරත්තයක්, රෝද තුනේ මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළෙඳ කටයුතු සඳහා යොදනු ලැබේ නම් ... | 5 00 |
| (ආ) වෙළෙඳාමට හැර වෙනත් දේකට යෙදනු ලැබේ නම් ... ... | 1 00 |
| 3. ගොන් දෙන්නා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් ... ... | 4 00 |
| 4. තනි ගොනා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් ... | 2 00 |
| 5. අත් කරත්තයක් ... ... | 2 00 |
| 6. ජින් රික්ෂෝ රථයක් ... ... | 2 50 |
| 7. අශ්වයෙක් හෝ පෝනියෙක් හෝ කොටලුවෙක් ... | 5 00 |
| 8. ගොනෙක් හෝ බූරුවෙක් ... ... | 0 25 |

එම්. ආර්. කාසිම්,
සභාපති.

1966. 11. 8 වන දින,
හම්බන්තොට නගර සභා කාර්යාලයේදීය.

11-883/1—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

## හම්බන්තොට නගර සභාව

### සුනඛ බද්ද—1967

සුනඛයන් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි පරිච්ඡේදයේ) 4 වන ඡේදය යටතේ හම්බන්තොට නගර සභා සීමාව තුල තබා ගන්නා සෑම බල්ලකුගෙන්ම රු. 2 ක්ද සෑම බැල්ලකගෙන්ම රු. 3 ක්ද අය කරන බවත් එම බද්ද 1967 අප්‍රේල් 1 වන දිනට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

එම්. ආර්. තාසිම්,
සභාපති.

1966. 11. 8 වන දින,
හම්බන්තොට නගර සභා කාර්යාලයේදීය.

11–883/2—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### 1967 වර්ෂයට දේපල වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ මෙම ගත වී යන අවුරුද්දට බලපවත්වන පහත සඳහන් වරිපනම් බදු 1967 වර්ෂයටද, එලෙසම පැනවීමට රුවන්වැල්ල සුළු නගර සභාව තීරණය කර ඇති බව තත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභාව තුල පිහිටා තිබෙන කුඹුරු හැර සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් (4%) වාර්ෂික බදු, පිළිවෙලින් මාර්තු 31 වෙනිදසින්, ජූනි 30 වෙනිදසින්, සැප්තැම්බර් 30 වෙනිදසින් හා දෙසැම්බර් 31 වෙනිදසින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඩී. ඇම්. හේමපාල,
සභාපති,
රුවන්වැල්ල සුළු නගර සභාව.

1966 නොවැම්බර් මස 3 වෙනි දින,
රුවන්වැල්ල සුළු නගර සභා කාර්යාලයේදී ය.

11–805/1—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද—256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

රුවන්වැල්ල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1967 වර්ෂයට රථවාහන හා සතුන් සඳහා බද්දක් පණවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු 31 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... | 5 00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළෙඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 1 50 |
| (ආ) වෙළෙඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 00 |
| ගොන් දෙන්නා බඳින සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 00 |
| තනි ගොනා බඳින සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 2 50 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 50 |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... | 2 50 |
| සෑම අශ්වයෙකුටම ... ... | 5 00 |
| සෑම අශ්වතරයෙකුටම හෝ සෑම බූරුවෙකුටම ... | 2 50 |

ඩී. ඇම්. හේමපාල,
සභාපති, රුවන්වැල්ල සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
රුවන්වැල්ල, 1966 නොවැම්බර් 3.

11–805/2—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා සුනඛ බද්ද—සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (පරිච්ඡේදය 334)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (334 වැනි පරිච්ඡේදය) අංක 4 වෙනි වගන්තිය යටතේ මෙම සුළු නගර සභා බල මණ්ඩලය තුළ තබාගෙන සිටින සෑම බල්ලෙකු වෙනුවෙන් ශත 50ක් ද, සෑම බැල්ලියක වෙනුවෙන් රුපියල් 1 ක්ද, ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1967 වර්ෂය සඳහා පනවා ඇති බවද, එකී ගාස්තු 1967 අප්‍රේල් 1 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද, රුවන්වැල්ල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩී. ඇම්. හේමපාල,
රුවන්වැල්ල සුළු නගර සභාවේ සභාපති.

1966 නොවැම්බර් 3 වෙනි දින,
රුවන්වැල්ල සුළු නගර සභා කාර්යාලයේදී ය.

11–805/3—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## දළුගම සුළු නගර සභාව

### 1967 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපණත (256 වන අධිකාරය) යටතේ ගතවී යන 1966 වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1967 වැනි වර්ෂයටද එලෙසම පැනවීමට දළුගම සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර, මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවලට වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වෙනිදසින්, ජූනි 30 වෙනිදසින්, සැප්තැම්බර් 30 වෙනිදසින් හා දෙසැම්බර් 31 වෙනි දායින් අවසන්වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ආර්. ඇස්. පෙරේරා,
සභාපති,
දළුගම සුළු නගර සභාව.

දලුගම සුළු නගර සභා කාර්යාලය,
මහර-කඩවත,
1966 ක්වූ ඔක්තෝබර් මස 14 වෙනි දින.

11–831—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

## දන්කොටුව සුළු නගර සභාව

**1967 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

### සුළු නගර සභා ආඥාපණත (256 වෙනි අධිකාරය)

දන්කොටුව සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) සුළු නගර සභා ආඥා පනතේ (256 වන අධිකාරයේ) 16 (1) වෙනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛණයෙහි එම වාහන හා සතුන් ඉදිරියෙන් සඳහන් කර ඇති ගණන් අනුව රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් ගෙවීගන යන 1966 වර්ෂයට මෙන්ම 1967 වර්ෂයටද පනවා ඇතිබව, සහ

(2) යථෝක්ත ආඥා පනතේ 163 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු මස 31 වෙනි දාට හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් ය.

ඇම්. පී. දිසානායක,
සභාපති,
දන්කොටුව සුළු නගර සභාව.

1966 නොවැම්බර් මස 2 වෙනි දින,
දන්කොටුව සුළු නගර සභා කායභාලයයේ දීය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රථයක්, කරත්තයක් :— | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| (බී) වෙළඳාම හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳුන සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බැඳුන බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම ජින්රික්ෂෝවක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටලුවෙක් සඳහා ... | 5 | 0 |
| සෑම බූරුවෙක් සඳහා ... ... | 1 | 0 |

11–911—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## අකුරැස්ස සුළු නගර සභාව

**1967 වර්ෂයට වරිපනම් බද්ද**

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ මෙම ගෙවීගන යන වර්ෂයට බලපවත්නා පහත සඳහන් වරිපනම් බද්ද එසේම 1967 වර්ෂයටද පැනවීමට අකුරැස්ස සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරණු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර, මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටි කුඹුරු හැර, අන් සියළුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් සියයට හතර (4%) බැගින් වූ වාර්ෂික බද්ද පිළිවෙලින් ජූනි මස 30 වැනිදායින් හා දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වන අයුරු කොටස් දෙකකින් ගෙවිය හැකිවේ.

ඩී. ඒ. සූරියආරච්චි,
සභාපති,
සුළු නගර සභාව, අකුරැස්ස.

සුළු නගර සභා කාර්යාලයය,
අකුරැස්ස.
1966 නොවැම්බර් මස 7 වැනි දින.

11–876/1—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## අකුරැස්ස සුළු නගර සභාව

**රථවාහන හා සතුන් පිළිබඳ බද්ද—1967**

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ 161 වැනි වගන්තිය යටතේ, මෙම ගෙවීගන යන වර්ෂයට බලපවත්නාවූ පහත සඳහන් උප ලේඛනයෙහි නම් කරන ලද රථ වාහන වලට හා සතුනට ඒ ලේඛනයෙහි සඳහන් වාහන හා සත්ත්ව බදු 1967 වර්ෂයටද එසේම පැනවීමට අකුරැස්ස සුළු නගර සභාව තීරණය කර ඇති බවත්,

2. යථෝක්ත ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු 31 වැනි දින අවසන් වීමට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

ඩී. ඒ. සූරියආරච්චි,
සභාපති,
සුළු නගර සභාව, අකුරැස්ස.

සුළු නගර සභා කාර්යාලයය,
අකුරැස්ස.
1966 නොවැම්බර් මස 7 වැනි දින.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් සයිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි, රෝදත්‍රයේ පාපැදි, හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... ... | 5 | 00 |
| සෑම බරකරත්තයක් සඳහා ... ... | 4 | 00 |
| සෑම බරභාගයක් හෝ අත්කරත්තයක් සඳහා ... | 2 | 50 |
| සෑම පාපැදියක් සඳහා ... ... | 1 | 00 |
| සෑම අලියෙකු සඳහා ... ... | 10 | 00 |
| සෑම අශ්වයෙකු සඳහා ... ... | 5 | 00 |
| සෑම බූරුවකු හෝ කොටළුවකු සඳහා ... | 2 | 50 |

11–876/2—6o.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

**1967 වැනි වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බදු**

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

ගලේවෙල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උප ලේඛනයෙන් විස්තර වන ගණන් අනුව 1967 වැනි වර්ෂයට රථවාහන සහ සතුන සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ අංක 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින්ද වේ.

ගා. කෙ. ආ. හෙන්දිරික් අප්පුහාමි,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
ගලේවෙල, 1966 නොවැම්බර් මස 6 වැනි දින.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| හැම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 2 | 50 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේනම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 3 | 0 |
| සෑම කරත්තයක් සඳහා ... ... | 3 | 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙකුට ... | 5 | 0 |
| සෑම බූරුවෙකුට හෝ ගොනෙකුට ... ... | 1 | 0 |

11–887—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

## ගලේවෙල සුළු නගර සභාව

### 1967 වර්ෂයට සුනඛ බදු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

### (477 වැනි අධිකාරය)

477 වැනි අධිකාරය වන සුනඛයින් ලියා පදිංචිකිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර, ගලේවෙල සුළු නගර සභා බල මණ්ඩලය තුල තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රු. 1 බැගින්ද, ගැණු සුනඛයෙක් සඳහා රු. 1.50 බැගින්ද 1967 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචිකිරීමේ ගාස්තුවක් 1967 වැනි වර්ෂයට අයකිරීමට පනවා ඇති බව ගලේවෙල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ගා. හෙ. ආ. හෙන්ද්‍රික් අප්පුහාමි,
සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
ගලේවෙල.
1966 නොවැම්බර් මස 6 වැනි දින.

11–880—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

### 1967 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ ගතවී යන 1966 වැනි වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1967 වැනි වර්ෂයටද එලෙසම පැනවීමට ගලේවෙල සුළු නගර සභාව තීරණකර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ගා. හෙ. ආ. හෙන්ද්‍රික් අප්පුහාමි,
සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
ගලේවෙල.
1966 නොවැම්බර් මස 6 වැනි දින.

11–879—66.11.18 දින අංක 14,722 දරණ ගැසට් පත්‍රය

---

## කඳාන සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරිය) යටතේ ගත වී යන 1966 වර්ෂයට බල පවත්නා පහත සඳහන් ඒකාබද්ධ වරිපනම් බදු 1967 වර්ෂයටද, සුළු නගර සභා සීමාව තුල එලෙසම පැනවීමට කඳාන සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුල තිබෙන කුඹුරු හැර, සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමෙන් සියයට හය බැගින්වූ ඒකාබද්ධ වරිපනම් බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකිවේ.

ජේරාඩ් බී. හල්පෙ,
සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
කඳාන, 1966 නොවැම්බර් 2 වැනි දින.

11–870/1—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## කඳාන සුළු නගර සභාව

### 1967 අවුරුද්ද සඳහා රථ වාහන සහ සතුන් පිළිබඳ බද්ද

### සුළු නගර සභා ආඥාපනත (256 වෙනි අධිකාරිය)

කඳාන සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ—

(1) සුළු නගර සභා ආඥාපනතේ (256 වෙනි අධිකාරියේ) 161 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයෙහි එම වාහන සහ සතුන් ඉදිරියෙහි සඳහන් කර තිබෙන ගණන් අනුව රථ වාහන සහ සතුන් පිළිබඳ බද්දක් ගෙවී යන 1966 වර්ෂයට මෙන්ම 1967 වර්ෂයටද පනවා ඇති බව, සහ

(2) යථෝක්ත ආඥාපනතේ 163 (3) වෙනි වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්ය.

ජේරාඩ් බී. හල්පෙ,
සභාපති.

1966 නොවැම්බර් මස 5 වැනි දින,
කඳාන සුළු නගර සභා කායර්‍යාලයේදීය.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන් දමේ වාහනයක් සඳහා ... | 5 00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක්, හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රථයක්, කරත්තයක්— | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 2 50 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 00 |
| ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 3 00 |
| තනි ගොනා බැඳි බර බාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 2 00 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 00 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 00 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක්, හෝ කොටළුවෙක් සඳහා ... ... ... | 3 00 |

11–870/2—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## කොච්චිකඩේ සුළු නගරසභාව

### 1967 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වන අධිකාරය) යටතේ ගතවී යන 1966 වැනි වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1967 වැනි වර්ෂයටද එලෙසම පැනවීමට කොච්චිකඩේ සුළු නගරසභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන වාර්ෂික වටිනාකම රු. 40 කට වැඩිවූ නිශ්චල දේපලවලට වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනි දයින්, ජූනි 30 වැනි දයින්, සැප්තැම්බර් 30 වැනි දයින් හා දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඩබ්ලිව්. ඊ. ඊ. ඒ. ජේ. ද සිල්වා,
සභාපති,
කොච්චිකඩේ සුළු නගරසභාව.

සුළු නගරසභා කාර්යාලය,
කොච්චිකඩේ.
1966 ක්වූ නොවැම්බර් මස දින.

11–841—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

## ක්ලිපඩ් මාවත—කොල්ලුපිටිය

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 268 වැනි පරිච්ඡේදය (26 වෙනි ඡේදය) යටතේ පිළියෙළ කරන ලද වියදම් කොටස් කිරීම**

වර්ෂ 1965.12.10 වෙනි දින සහ ගැසට් අංක 14,581 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරණ ලද ප්‍රාරම්භක වියදම් කොටස් කිරීම සම්බන්ධව සහ සියළුම අයිතිකරුවන්ට භාරදෙන ලද අංක ඇම්ඊ/සී. සී/පී. ඇස් 8/64 සහ 66.1.22 දින දරණ දන්වීමේ ප්‍රකාර ගෘහ සහ නගර සංවර්ධන ආඥා පණත් (ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 268 වෙනි පරිච්ඡේදය) 26 වෙනි ඡේදය යටතේ කොළඹ නාගරික සභාව පුද්ගලික වීථිය තැනීම සම්බන්ධයෙන් සලකා බැලීමෙන් සහ යම්කිසි දන්වීමකින් අනතුරුව දෙපැත්තේම අයිතිකරුවන් තැනීමේ වියදම මුල් කොටසක් වශයෙන් සැමදෙනාගෙන් අයකරගැනීමේ අයිතියට යටත්ව නාගරික කොමසාරිස්වරයා විසින් පිළියෙල කරන ලද සංශෝධිත වියදම් කොටස් කිරීම අනුමත කර මෙහි පහත සඳහන් වැඩ සියල්ලක්ම හෝ ඉන් සමහරක් කිරීමට යෝජනා කරන්නීය.

(අ) දෙපැත්තේම අඩිනට තණ පිඩැලි සහිත සහ අර්ධ කවාකාර කොන්ක්‍රීට් කාණුගල් යෙදූ, අඩි 20 ක් පළලැති අහල් 4ක් ඝණට තාර දැමූ විදුලි පහන් සහිත වූ රථවාහන මාර්ගයක්.

මෙම වියදම් කොටස් කර තිබෙන්නේ දැනට ව්‍යවහාර කම්කරු ගාස්තු සහ ද්‍රව්‍ය මිළ අනුව නිසා නියම වශයෙන් වැඩ කරණ කාලයේ දී කම්කරු ගාස්තු සහ ද්‍රව්‍ය මිළ අඩු වැඩි වීමේ හේතුවෙන් මෙම වියදම් කොටස් කිරීමද වෙනස් විය හැකිය.

මෙම වියදම් අයකරගනු ලබන්නේ අවුරුදු 10ක කාලයක් ඇතුළතය. තවද, මෙම වැඩ කිරීමේ වියදමින් කිසිම කොටසක්වත් නොදැරීමට නාගරික සභාව වැඩිදුරටත් යෝජනා කරන්නීය.

| තක්සේරු අංකය | | වීථියේ නම | | අයිතිකරුගේ නම සහ ලිපිනය | | තැනීමේ වියදම | | වියදම් කොටස් කිරීම | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රු. | ශ. | රු. | ශ. |
| 3 | ... | ක්ලිපඩ් මාවත | ... | එන්. කේ. චොක්සි මයා,. 3, ක්ලිපඩ් මාවත, කොළඹ 3 ... | ... | 6,390 | 0 ... | 6,390 | 0 |
| 5 | ... | එම | ... | දෙස්තර එස්. නඩරාජා මයා., 5, ක්ලිපඩ් මාවත, කොළඹ 3 ... | ... | 2,835 | 0 ... | 2,835 | 0 |
| 7 සහ 9 | ... | එම | ... | ඒ. ඇම්. තහා මයා. 7, ක්ලිපඩ් මාවත, කොළඹ 3 ... | ... | 4,815 | 0 ... | 4,815 | 0 |
| 11 | ... | එම | ... | එස්. එස්. පෙරේරා මිය., 11, ක්ලිපඩ් මාවත, කොළඹ 3 ... | ... | 2,430 | 0 ... | 2,430 | 0 |
| 15 | ... | එම | ... | පත්මාවතී පෙරේරා මිය., විවාහයට පෙර වික්‍රමසිංහ ගුණතිලක, "ශාන්ති" පානදුර | | 6,975 | 0 ... | 6,975 | 0 |
| 91 සහ 19/1 | ... | එම | ... | එම්. බිලිමෝරියා මිය., 19, ක්ලිපඩ් මාවත, කොළඹ 3 ... | ... | 1,282 | 50 ... | 1,282 | 50 |
| 21 සහ 21/1 | ... | එම | ... | ජේ. එච්. බිල්මොරියා මයා., 21/1, ක්ලිපඩ් මාවත, කොළඹ 3 | ... | 2.745 | 0 ... | 2,745 | 0 |
| 23 සහ 23/1 | ... | එම | ... | පී. එච්. බිල්මොරියා මයා., 19/1, ක්ලිපඩ් මාවත, කොළඹ 3 | ... | 2,587 | 50 ... | 2,587 | 5 |
| 25 | ... | එම | ... | සීමා සහිත කොමාර්ෂල් කොම්පැනිය බාරේ පී. එෆ්. බිල්මොරියා මයා., කොළඹ | | 1,710 | 0 ... | 1,710 | 0 |
| 27 | ... | එම | ... | එම්. බිල්මොරියා මිය., 19, ක්ලිපඩ් මාවත, කොළඹ 3 ... | ... | 2,250 | 0 ... | 1,450 | 0 |
| 253 | ... | ඩුප්ලිකේෂන් පාර | ... | පී. අරුලයියා මයා., 280, ඩුප්ලිකේෂන් පාර, කොළඹ 3 ... | ... | 3,420 | 0 ... | 920 | 0 |
| 24 | ... | ක්ලිපඩ් මාවත | ... | විල්මට් පොන්සේකා මයා., 25/2; 25 වෙනි පටුමග, කොළඹ 3 | ... | 4,747 | 50 ... | 4.747 | 50 |
| 22 | ... | එම | ... | එල්. එල්. ටී. පීරිස් මයා., 22, ක්ලිපඩ් මාවත, කොළඹ 3 ... | ... | 3,195 | 0 ... | 3,195 | 0 |
| 20 | ... | එම | ... | ආර්. ඇස්. වී. ජොලියර් මයා., 20, ක්ලිපඩ් මාවත, කොළඹ 3 ... | ... | 2,362 | 50 ... | 2,362 | 50 |
| 12 | ... | එම | ... | පරින් කැප්ටන් මෙනවිය, මයුරා පෙදෙස, කාළඹ 6 ... | ... | 3,847 | 50 ... | 3,847 | 50 |
| 22/1 | ... | එම | ... | පරින් කැප්ටන් මෙනවිය, මයුරා පෙදෙස, කොළඹ 6 ... | ... | 1,350 | 0 ... | 1,350 | 0 |
| 8 | ... | එම | ... | සෝලි. එඩල්ජි කැප්ටන්, මයුරා පෙදෙස, කොළඹ 6 ... | ... | 6,975 | 0 ... | 6,975 | 0 |
| 4 | ... | එම | ... | එම්. එස්. එම්. සලීම් මිය., නො. 4, ක්ලිපඩ් මාවත කොළඹ 3 ... | ... | 2,857 | 50 ... | 2,857 | 50 |
| 2 | ... | එම | ... | එස්. බී. නානායක්කාර මයා., 2, ක්ලිපඩ් මාවත කොළඹ 3 ... | ... | 2,970 | 0 ... | 2,970 | 0 |
| 6 | ... | එම | ... | ජී. ඒ. දසනායක මයා., 6, ක්ලිපඩ් මාවත, කොළඹ 3 ... | ... | 3,285 | 0 ... | 3,185 | 0 |
| | | | | | | 69,030 | 0 | 65,630 | 0 |

නගර ශාලාව,
කොළඹ 7,
1966 නොවැම්බර් 1 වැනි දින.

බ. ඔ. ජයසිංහ,
නාගරික කොමසාරිස්.

**11—817—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය**

---

## යටියන්තොට සුළු නගර සභාව

**1967 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු**

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 අධිකාරය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාර යටියන්තොට සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලකු වෙනුවෙන් රු. 1 ක්ද, බැල්ලියකු වෙනුවෙන් රු. 1.50 ක්ද ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1967 වර්ෂ යට පනවා ඇති බවද, එකී ගාස්තු 1967 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. වින්සන්ට් පෙරේරා,
සභාපති.

සුළු නගර සභා කායාලය ය,
යටියන්තොට, 1966.11.8.

**11—874/1—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය**

---

## යටියන්තොට සුළු නගර සභාව

**1967 අවුරුද්ද සඳහා රථ වාහන සහ සතුන් පිළිබඳ බද්ද**

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

යටියන්තොට සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උප ලේඛනයෙන් විස්තර වන ගණන් අනුව 1967 අවුරුද්දට රථ වාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී ආඥාපනතේ අංක 162 (3) දරණ වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින් වේ.

කේ. වින්සන්ට් පෙරේරා,
සභාපති.

සුළු නගර සභා කායාලය ය,
යටියන්තොට, 1966.11.8.

**උපලේඛනය**

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් සයිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| සෑම පාපැදියකට හෝ රෝදත්‍රයේ පාපැදියකට හෝ පාපැදි කාරයකට හෝ කරත්තයකට හෝ රෝදත්‍රයේ පාපැදි කාරයකට හෝ කරත්තයකට— | | |
| ... (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කෙරේ නම් ... | 3 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කාර්යයක් සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| සෑම ගොන් බඳින කරත්තයක් සඳහා ... ... | 4 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා | 5 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 1 | 0 |

**11–874/2—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය**

## මැදපත්තු දකුණු ගම්සභාව—පොළොන්නරුව දිස්ත්‍රික්කය

1947 අංක 44 දරණ මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ (සංශෝධිත) ආඥාපනතේ 6 වන ඡේදයෙන් සංශෝධිතවූ පරිදි, එම ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදය) 7 වන ඡේදය යටතේ කෙරෙන දැනුම්දීමයි.

මෙහි පහත විස්තර කෙරෙන උපලේඛණයේ සඳහන් අයවළුන් විසින් ඒ ඒ ස්ථානයන්හි එළ හරක් මස් වෙළඳාම පවත්වාගෙන යාම සඳහා 1967 වර්ෂයට ඉල්ලුම්කර තිබෙන බවත් එම බලපත්‍ර නිකුත් කිරීම ගැන පොළොන්නරුව මැදපත්තු දකුණු ගම්සභා සීමාවතුල පදිංචි ඕනෑම කෙනෙකු විරුද්ධ වන්නේ නම් තමතමන්ගේ විරුද්ධත්වය ප්‍රකාශණ (කරුණු සහිතව) පිටපත් දෙක බැගින් යුතුව මෙම දන්වීම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධවූ දින සිට දින 14 ක් ඇතුලතදී මා වෙත ඉදිරිපත් කරන ලෙයත් මෙයින් දැනුම්දෙනු ලැබේ.

1966 11.7. වන දින,
කදුරුවෙල මුස්ලිම් කොළනියේ
ගම්සභා කාර්‍යාලයේදිය.

ආර්. බී. උඩුගොඩගේ,
මැදපත්තු දකුණු ගම්සභාවේ ප්‍රධානතැන.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳමේ පිළිවෙල | වෙළඳම් කරන ස්ථානය |
|---|---|---|
| අලියාර් මොහමඩ් ලෙබ්බෙ, නො. 14, මුස්ලිම් කොළණිය, කදුරුවෙල ... | එළහරක් මස් හා එළු මස් ... | නො. 14, මුස්ලිම් කොළණිය |
| ජේ. එස්. මාරිජන්, නො. 11, මුස්ලිම් කොළණිය, කදුරුවෙල ... | එළුමස් ... ... | නො. 11, මුස්ලිම් කොළණිය |
| ඒ. එල්. මොහමඩ් ලෙබ්බෙ, නො. 18, මුස්ලිම් කොළණිය, කදුරුවෙල ... | එළහරක් මස් හා එළු මස් ... | නො. 18, මුස්ලිම් කොළණිය |
| ඒ. සී. ඒ. පතුල්ලා, නො. 22, මුස්ලිම් කොළණිය, කදුරුවෙල ... | එළහරක් මස් හා එළු මස් ... | නො. 22, මුස්ලිම් කොළණිය |

11–888—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## අඹන්පොල ගම්ප්‍රදේශයේ—අඹන්පොල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛණයේ දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1967 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව අඹන්පොල ගම්සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ සඳහා දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනය ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 20 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම්දෙමි.

එච්. ඇම්. රත්හාමි,
අඹන්පොල ගම්සභාපති.

ගම්සභා කාර්‍යාලය
අඹන්පොල,
6.11.66

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳම |
|---|---|---|
| මහමදුලෙබ්බෙගේ අබ්දුල් මජීදු ... ... ... | අඹන්පොල ... ... | හරක් මස් |

11–840—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## දන්කොටුව සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයෙහි නම් සඳහන් අය විසින් 1967 වර්ෂයට එහි සඳහන් ස්ථානයන්හි මස් කඩ පවත්වාගෙන යැමට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන දන්කොටුව සුළු නගර සභා සීමාවතුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (සංශෝධිත ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 272 වෙනි අධිකාරය) 7(2) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | ස්ථානයේ නම |
|---|---|---|
| 1. ඒ. ඩී. වින්සන් අප්පුහාමි ... ... ... | හරක් මස් ... ... | පො. වෙ. සැලේ අංක 8 දරණ කඩය |
| 2. ඒ. ඩී. වින්සන් අප්පුහාමි ... ... ... | එළු මස් ... ... | පො. වෙ. සැලේ අංක 7 දරණ කඩය |
| 3. ඒ. ඩී. වින්සන් අප්පුහාමි ... ... ... | ඌරු මස් ... ... | පො. වෙ. සැලේ අංක 6 දරණ කඩය |

ඇම්. පී. දිසානායක,
සභාපති,
සුළු නගර සභාව, දන්කොටුව.

1966 ක්වූ නොවැම්බර් මස 2 වෙනි දින,
දන්කොටුව, සුළු නගර සභා කාර්යාලයේදිය.

11–844—66.11.18 දන අංක 14,722 දරන ගැසට් පත්‍රය

## වැල්ලව ගම්සභා ප්‍රදේශය—කුරුණෑගල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ නම් සඳහන් අයවළුන් විසින් එහි දක්වෙන ස්ථානවල 1967 වර්ෂයට මස්කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ලව ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධතාවයක් ඇතිනම් එය විස්තර සහිත ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටින සේ සකස් කොට මෙම දන්වීම ගැසට් පලවුන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්ට සැලැස්විය යුතු බැව් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. යූ. ඇල්. ඇම්. ෂහීඩ් මයා., 17/2, යල්ලව පිටිය, කුරුණෑගල ... | ... ගව මස් | ... අංක 17/2, නුවර පාර, මල්ලව පිටිය, කුරුණෑගල |
| 2. කේ. නූහු ලෙබ්බෙ මයා., 21/6ඒ, තෙලියා ගොන්න, කුරුණෑගල | ... ගව මස් | ... වැල්ලව ප්‍රසිද්ධ වෙළඳ පොල භූමිය |
| 3. ඒ. ඇම්. ඇම්. බුහාරි මයා., නුවර පාර, මල්ලව පිටිය, කුරුණෑගල | ... ගව මස් | ... රුලපනා කුඹුර, නුවර පාර, මල්ලව පිටිය |
| 4. අයි. ඇල්. අසනාර් ලෙබ්බෙ මයා., 34, පුත්තලම් පාර, කුරුණෑගල | ... ගව මස් | ... කුඩාගල්වැටියේ වත්ත, දඹුලු පාර, තෝරයාය |

ඩී. පී. දවිත්,
වැල්ලව ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
මරළුවාව, කුරුණෑගල
1966 නොවැම්බර් 3 දින.

11–887—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## නුවර එළිය දිස්ත්‍රික්කයේ කඩවත් සතර ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් 1967 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා ඌරු මස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑමට හා මස් වර්ග ටින් වල ඇසිරීමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමට නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඩවත් සතර ගම් ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේනම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥපනතේ (201 වන අධිකාරයේ) අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධනයවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| අංකය | ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇස්. ඇම්. ෂරීප් ... | ... හරක් මස් කඩයක් ... ... | ... අංක 60, නානුඔය |
| 2. | ඇස්. ඇම්. රාවුෆ් ... | ... හරක්මස් කඩයක් ... ... | ... අංක 54, නානුඔය |
| 3. | ඇම්. මුස්ථපා ... | ... එළු මස් කඩයක් ... ... | ... අංක 22, නානුඔය |
| 4. | ජේ. ඇන්ඩර්සන් ... | ... සතුන් මැරීම (ඌරන් සහ හරකුන්) සහ මස් වර්ග ටින් කිරීමට | ... මිපිලිමාන්න, රුවන්එළිය |
| 5. | වෛ. ඇම්. ඇස්. සේගු මොහම්මඩ් | ... හරක් මස් කඩයක් ... ... | ... කඳපොල |
| 6. | වෛ. ඇම්. ඇස්. සේගු මොහම්මඩ් | ... එළු මස් කඩයක් ... ... | ... අංක 171, කඳපොල |

ජී. ඒ. දවිත් අප්පුහාමි,
කඩවත් සතර ගම්සභාවේ සභාපති තැන.

කඩවත් සතර ගම්සභා කාර්යාලය,
නානුඔය, 1966.11.9.

11–877—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## හාපිටිගම් කෝරළයේ උඩුගහ ගම්සභාව

### මහජන පාරවල්—ගම්සභා ආඥපනත (257 පරිච්ඡේදය)

**වරද නිවරද කිරීම.**

1966 සැප්තැම්බර් මස 16 වෙනි දින අංක 14,713 දරණ ගැසට් පත්‍රයේ 660 වැනි පිටුවේ කොටස්ශ අංක 3 ඇලපිලියාව පාර සම්බන්ධයෙන් පළකර තිබූ දැන්වීම පහත අයුරින් සංශෝධනය කළ බව මෙයින් දැනුම් දෙමි.

ඩී. සී. ජී. රණසිංහ,
උඩුගහ ගම් සභාවේ සභාපති.

1966.11.2 දින,
මීරිගම, උඩුගහ ගම්සභාව.

**යෝජනාව.**

වර්ෂ 1966.9.16 දින දරණ අංක 14,713 දරණ (අංක IV පළාත් පාලන) ගැසට් පත්‍රයේ 660 වැනි පිටුවේ පළකර ඇති අංක 3 දරණ නියෝජිත කොටසේ ඇලපිලියාව පාරේ මායිම් වැරදි බැවින් ඒ පිළිබඳ විරුද්ධත්වය පළකර ඩී. සී. ඒ. ගුණවර්ධන මහතා ඇතුළු තවත් අයගේ අත්සන සහිත ලැබී තිබූ පෙත්සම සභාව ඉදිරියේ තැබීමෙන් පසු යථෝක්ත පාරේ මායිම් නිවැරදි කර නැවත ගැසට් පත්‍රයෙහි පළකරවියයුතුයයි එච්. පී. එඩ්වින් පීටර් මයා. සභාව ඉදිරියේ තබන ලදි. එම යෝජනාව ඈන්. එච්. උපතිස්ස මහතාගේ ස්ථිරත්වයෙන් ඒකච්ඡන්දයෙන් සභා සම්මතවිය.

### සංශෝධිත—උපලේඛනය

පාරේ නම: ඇලපිලියාව පාර.

පාරේ දිග: පාරේ දිග දැම්වැල් 60 අඩි 40යි. පළල අඩි 20යි. නාල්ල පාරේ 2 වැනි සැතපුම් කණුවේ සිට නොව නාල්ල පාරේ 1 3/4 සහ 2 කනු අතර.

| වමට | දකුණට |
|---|---|
| 1. බෙලිගහමුලවත්ත. | 1. කහටගහවත්ත. |
| 2. ගලබඩවත්ත. | 2. ඉරිහැපිපොලේවත්ත. |
| 3. ගලබඩවත්ත. | 3. කැටකාලගහවත්ත නොහොත් මීගහවත්ත. |
| 4. ගලබඩවත්ත. | 4. මීගහවත්ත. |
| 5. බෙලිගහවත්ත. | 5. බෝමළුවවත්ත. |
| 6. ගොඩ ඇදලේ වත්ත. | 6. ඇටඹගහවත්ත. |
| 7. වෙලබඩ නොහොත් සියඹලා ගහවත්ත. | 7. වෙලබඩ නොහොත් සියඹලා ගහවත්ත. |
| 8. වෙලබඩ වත්ත. | 8. වෙලබඩවත්ත. |
| 9. වෙලහබඩ වත්ත. | 9. හල්ගහකුඹුර. |
| 10. කටුකුරුඳුගස් යාය. | 10. කටුකුරුඳුගස් යාය. |

11–836—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් වික්‍රිණීම පිණිස 1967 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණු සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම "ගැසට්පත්‍රයේ" පලවන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරන ආඥාපණතින් සංශෝධනයවූ අංක 6 දරණ ආඥාපණත යටතේ දැනුම් දෙමි.

### උපලේඛනය

**ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :** ශේහු අප්දුල් රශාක්, නො. 65, වඳාකඩ පාර, පොතුහැර ; **ස්ථානය සහ වෙළඳාම :** නො. 63, වඳාකඩ පාර, පොතුහැර ; අංක 63, දරණ ස්ථානයේ එළහරක් මස් වික්‍රිණීම පිණිස කඩයක් තබාගැනීම.

තිස්ස බී. අමුණුගම,
සභාපති, පොතුහැර, ගම්සභාව.

ගම්සභා කායඛීලය,
පොතුහැර. 1966 නොවැම්බර් 5.

11–843/1—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් වික්‍රිණීම පිණිස 1967 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධවන කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහායැයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම "ගැසට්පත්‍රයේ" පලවන දින සිට 14 දිනක් ඇතුලත මාවෙත ලියා එවීමට බලයතිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 අංක 44 දරන ආඥාපනතින් සංශෝධනයවූ අංක 6 දරන ආඥාපණත යටතේ දැනුම් දෙමි.

### උපලේඛනය

**ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :** ශේහු අප්දුල්රශාක්, නො. 65, වඳාකඩ පාර, පොතුහැර ; **ස්ථානය සහ වෙළඳාම :** නො. 63, වඳාකඩ පාර, පොතුහැර ; අංක 63 දරන ස්ථානයේ එළහරක් මස් වික්‍රිණීම පිණිස කඩයක් තබාගැනීම.

තිස්ස බී. අමුණුගම,
සභාපති, පොතුහැර ගම්සභාව.

ගම්සභා කායඛීලය,
පොතුහැර. 1966 නොවැම්බර 5.

11–843/2—66.11.18 දින අංක 14,722 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. එහි දැක්වෙන නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින් ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1966

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| අගෝස්තු ... | 66. 8. 5 | සිකුරාද ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද ... | 66 9. 9 | සිකුරාද | ප.ව 3.30 |
| | 66. 9.23 | සිකුරාද ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද .. | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10 7 | සිකුරාද ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | 66.12. 2 | සිකුරාද ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

බර්නාඩ ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජුලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි